


# “නිවහල් සිතුවිලි”




“රුවන් වළා දුහුල් හඬින්
පෙරී සඳේ රිදී කැළුම්....”

“දන්නවා ද කවුද සින්දුව කියන්නේ කියලා ?” පන්හිඳ තැටි වාදන යන්ත්‍රයේ හඬ ටිකක් වැඩිකරන ගමන් ඇහුවා.

“ඇයි නැත්තේ ? නන්දා මාලිනී නේ ?” පින්සල ලේසියෙන් ම උත්තර දුන්නා.

“ඒක ඇත්ත; කිව්වේ නන්දා මාලිනී තමයි ! ඒත් මන් ඇහුවේ මේ කියන්නේ කවුද කියලා”

“කවුද හැබෑටම ?” පින් ට ඒක නම් ප්‍රශ්ණයක් වුණා.

“නලිනි !” පන් ඔය කියන්නේ නලිනි දේවේන්ද්‍ර ගණිතාචාර්යවරිය ගැන.

“සන්නස” පත්තරේටත් “ගණන් ඉලක්කම් අතරින් වී.සී.ඊ. විභාග යට” ලිපි පෙළක්ම කරන්න කරුණු කාරනා කියා දුන්නෙ.

“තම තමන්ගේ විනෝදයට කට්ටිය එකතු වුණාම සින්දුවක් කියලා විනෝද වෙන අය අතරේ මේ වගේ දස්කම් තියෙන අය කොච්චර ඇද්ද ? ඇයි අපි ඒ අය ගැන නොලියන්නේ ?” පින් ඇහුවෙ පන් වැරදිකාරයෙක් විදියට හිතලයි.

“කොහොමද එදා නිදහස් උත්වය දා අර මුස්ලිම් දැරිවිගේ සින්දුව ? එළ නේද ?” පන් කිව්වේ “බොක්කෙන්ම”යි.

“ඇත්තෙන් ම එයැයිට උත්සවයේ ඉඩක් දුන්න එක නම් හරිම වටිනවා. හොඳට සිංහල උරුවට වචන ශබ්ද කරලා නියම ශ්‍රැතියට, තාලයට කිව්වා. පොඩි කාර්මික දෝසයක් වුණත් ඒක එයැයිගේ දෝසයක් නෙවිනේ. කවුද ඒ දැරිවි ?”

“නම අයේෂා මව්ජූඩ්. ඇත්තටම ඒත් ඔය වගේ හැංගිලා උන්න ළමයෙක්නෙ. මෙහෙදි වැඩ කටයුතු කරන්නේ ඉංග්‍රීසියෙන්. ගෙදර කතා කරන්නේ දෙමළ භාෂාවෙන්ලු. “හෙළ ජාතික අභිමානේ වගේ අමාරු වචන තියෙන ඉහළ හඬින් ගායනා කරන්න වෙන සින්දුවක් තෝරාගත්ත එකම වටිනවා. වැඩේටත් කදිමට ගැළපුණානේ.”

“අළුත් පරම්පරාවේ අයව අඳුන්වලා දෙන එක වගේම අපේ පැරැ ණ්ණන්වත් සිහිපත් කරලා බුහුමන් දක්වන එක ඒ පැරැන්නෝ ගැන නොදන්න අළුත් අයටත් හොඳ ආදර්ශයක් !”

“ඔය කිව්වේ ෂෙල්ටන් ප්‍රේමරත්න මහත්තයා ගැන වෙන්නැති ?” ප්‍රේමරත්න මාස්ටර්ගෙ නම මුලටම කියවෙන්නේ චිත්‍රපටි සංගීතය ගැන කතා කරනකොට. එක්දහස් නවසිය හතලිස් ගණන් පනස් ගණන්වලදී චිත්‍රපටි සංගීතයට අපේ කම කවපු ප්‍රවීන සංගීතයන්ගෙන් මුලටම ඉන්න කෙනෙක් උන්නැහේ. “දස්කොන් ”, “සිහින හතක් ”, “බඩුත් එක්ක හොරු”, “කළණ මිතුරෝ” වගේ චිත චිත්‍රපටි ගණනාවකම සංගීත අධ්‍යක්‍ෂණය කළේ ප්‍රේමරත්න මාස්ටර්. “හුණුවටයේ කතාව”, “හොටබරි යුද්ධය”, “ තහංචි”, “සතුන්තලා”, “උතුරුකුරු සටන” වගේ වේදිකා නාට්‍යවල සංගීතයත් උන්නැහේගේ. හැටවෙනි නිදහස් දින උත්සවයට ෂෙල්ටන් ප්‍රේමරත්න මහත්තැන්ගේ ගායනාත් එක්කහු වුණා.

“ඇත්තටම එදා උත්සවය හොඳට කෙරුණා නේද ? අපේ රටේ උපන් ගවනර්තුමාත් බොහෝම උනන්දුවෙන් ඉවරයක් වෙනකල්ම උන්නා. අපරාදේ කියන්න බෑ; සතියේ දවසක් වෙලත් අපේ අය ඉතිරෙන්න ඇවිල්ලා උන්නනේ.”

“කතා නම් ටිකක් දික් වුණා. ඒත් ඉතින් ඇතුවත් බැරි-නැතුවත් බැරි දෙයක්නේ-කතා.” පින් හිටපු ගමන් හරස්පද දානවා.

“නැටුම් එහෙමත් මදි නොකියන්න තිබුණා. අපේ ළමයි සිංහල උජාරුවට අතපය හසුරුවන්න දන්නවා. කාලෙකට ඉස්සර තිබුණේ එක්කෝ ඒරොප්පෙ පන්නෙට අතපය විසි කෙරිලි. එහෙම නැත්තං අල්ලපු රටේ හැටියට ගැස්සිලි. පන් “අල්ලපු රටේ” කියලා කිව්වේ ලංකාවට අල්ලපු රටට. “ඒ අතින් අපේ නැටුම් උගන්නන ඇයින්ට කෘතඥ වෙන්න ඕන.

“ඒ ඒ හැටියට විසිකිරිලි, ගැස්සිලි කරන්න නොදන්නෙත් නෑ.” පන් පුරවගෙන යන ප්‍රහේලිකාවට පින් ආයෙත් හරස් පදයක් හරස් කළා.”

“ඒ ඉතින් ඒ ඒ නැටුමට, සංගීතයට ඕන හැටියටනෙ.” පන් වැඩේ අත අරින්නේ නෑ.

“කෑම බීමත් හරියට; ඒ ඒ අය මදි නොකියන්න සපයලා



සිසිර දිසානායක

ඉරිදා උදේ 3zzz රේඩියෝ එකේ සිංහල වැඩසටහනෙ “විමසුම” අංගයට ප්‍රසන්න කුරුකුලරත්න උන්නැහේ කියපු කතාවක් මතක් වුණා පන් ට.

“මේ ත්‍රස්තවාදී බෝම්බ අස්සේ මොන නිදහසක් ද එක අතකට ?” පන් තමන්ටම කියාගත්තා. නිමල් අල්විස් උන්නැහෙගේ රූපවාහිනියේ මිහිරි දිසානායක ප්‍රවෘත්ති ප්‍රකාශිකාගේ හඬ අතරින් තිරයට ආව ලංකාවේ තාත්තා කෙනෙකුගේ අඳෝනාව පන්ගේ හිතේ දෝංකාර දුන්නා. එයැයිගෙ දුව ත්‍රස්ත බෝම්බයකින් අන්තරා වෙලා. පන් හෙම්හිට කමිස අතෙන් ඇහැ අද්දර නළියපු කඳුළු බින්දුවක් පිහිදා ගත්තා.

“රටේ මොන කළබල තිබුණත් අපේ දේවල් නොකර ඇරියොත් ඒක ඉතින් ත්‍රස්තයින්ට ම ගිය රටක් වෙයි...” නැද්ද මං අහන්නේ ? පින් තවත් හරස් ප්‍රශ්ණයක් අරගෙ න කාමරයෙන් එළියට ආවේ හරියට පන්ගෙ හිත කියෙව්වා වගේ.

“එක අතකට ඒ කතාව ඇත්ත. අවුරුදු විස්සක් තිහක් තිස්සේ දළදා පෙරහැර නොකර උන්නා නං අපෙන් වැඩක් තියෙයිද ? නිදහස නැතිවෙලා තියෙන්නෙ ත්‍රස්තවාදෙ හන්දම නෙවී; යටත් විජිත කාලෙ ඉඳන් අපේ සමහර ඈයෝ කරපින්නාගෙන ඉන්න ගැතිකම් හන්දා. මතකද පාලිත ගනේවත්ත මහත්තයා එක්ක එස්. බී. එස්. රේඩියෝ එකේ කතා කරපු එස්. පියසේන මහත්තයා කියපු කතාව ? ඉන්දියාවටයි ලංකාවටයි කොන්දේසි ඇතිව නිදහස ලැබුණෙ එකම වකවානුවෙලු. ඉන්දියාව ඊට අවුරුදු දෙකකට විතර පස්සේ සම්පූර්ණයෙන්ම නිදහස් ස්වෛරී ජනරජයක් වුණත් අපිට ඒ දේ කරගන්න අවුරුදු විසිපහක් ගියාලු.” එස්. පියසේන උන්නැහේ මේ රටේ ඉන්න අපේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙක්.

“කාට කියන්න ද ඉතින් ඕවා. අපේ දෙයක් අපේ අය කවද්ද අගය කළේ. ඒකට ඉන්දියාව. ඔය ගැති ගති හිත්වලින් තුරන් වුණ දාට තමයි හැබෑ නිදහස ලැබෙන්නේ.

“අපේ දේවල් අගය කරන අය නැත්තෙම නෑ. දැක්කද නිදහස් උත්සවයට ලංකාවෙන් ආව සංස්කෘතික කණ්ඩායම ඉදිරිපත් කරපු නැටුම් ? ඇයි ඩැන්ඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථානයට ආධාර ලබා ගන්න කරපු සංස්කෘතික සංදර්ශනය ? ඒ ගැන ටිකක් ලියන්න ඕන.” පන් ලියන මේසයේ වාඩිවුණා.

“ලියන දේකට ගැලපෙනවනම් මේකත් යවන්න.” පින් කාමරේ ඉඳන් එළියට එනකොට අරන් ආව “ඒ4” කොලය පන්ට දුන්නා. හැටවෙනි නිදහස් උත්සවයට පින් ඇඳපු ලාංඡනයයි ඒ.

“මට ඕක වේදිකාවෙ එල්ලාගන්න උදව් කරපු රොහාන් වීරසිරිටයි එයැයිගෙ යාළුවටයි දෙන්නටම මන් ස්තූති කළාය කියලත් ලියන්න.” පින් කොහේදෝ යන්න එළියට බැස්සේ අමරදේවතුමාගෙ සින්දුවකුත් පුළුවන් හැටියට කියාගෙන. පන් ලියන්න ගත්තා.

මඟුල් බෙර පූජාව, නාග ගුරුළු, සබරගමු නර්තනය, තෙල්මේ, මයුරා වන්නම, රබන් කරකැවීම, පන්දම්පාලිය/කළු යකා, සුරඹා වල්ලිය, වෙස් නැටුම්, සළු පාලිය, “පතුරු” නැටුම්, බෙර වාදන සංදර්ශනය වැනි අංගයන්ගෙන් සමන්විත වූ සංස්කෘතික සංදර්ශනය කලකට පසු දැකගන්නට ලැබුණු වටිනා සංදර්ශනයක් විය. මෙතෙක් දක්නට නො ලැබුණ අංග අතර “පතුරු නැටුම” විශේෂ අංගයකි. ලී කෙළි සෙල්ලමට තරමක් සමාන වූ මෙම අංගයේ ලී වෙනුවට එකට බැඳුන පතුරු කැබලි දෙකක් නොයෙකුත් ආකාරයෙන් නටවමින් ද තට්ටු කරමින් ද නැංවූ ශබ්දය නර්තනයේ රිද්මයට පණ කැවීය.

මයුරා වන්නම නැටුමේ දී අත්ලෙහි රඳවාගත් මොණර පිල් ඇසක් සහිතව අත්ල ලෙලවනු ලැබූයේ මොණරෙකු පිල් විදහා රඟපානා විට සැලෙන පිල් සිහිග න්වමිනි. මින් පෙර දැක ඇතත් රබන් නවයක් එකවර තරඟවමින් එම ශිල්පියා පෑ හපන්කම් ඇගයිය යුතුයි. ...ි ආකාරයේ කරණම් මෙන්ම ...න යක් නැටුම් ප්‍රේක්‍ෂකයින් ...වීය. ප්‍රේක්‍ෂකාගාරය සමඟින් ...ාඩනගා ගැනීමට හැකි වූයේ ...යාවන් නිසා නොවේ ද ? මෙලනි ...ිලකසිරි නිවේදක දෙපලගේ සමබර ඉදිරිපත් කිරීම ප්‍රශස්තයි. තම සීමාවන් ඉක්මවා නොගොස් අවස්ථානුකූලව ප්‍රසංගය මෙහෙය වූ අන්දම අපූරුයි. ෂෙල්ටන් ප්‍රේමරත්නයන්ගේ ගායනා ද එක් වීය සිය දූ පුතුන් සමඟින්. විදුලි ආලෝකකරණය ද අවස්ථ ානුකූලව කළ ජගත් කොතලාවල හා විශ්ව යන දෙපළ ද නිර්මාණාත්මක අංගයන් කළ එළි කරවූහ. ප්‍රසංගයේ ඇඳුම් ආයිත්තම් ඉතාමත් ම ආකර්ශනීය වූ බව නොකිව මනාය. ශිල්පී ශිල්පිනියන් නාමිකව නොලියුවද ඔවුනගේ හපන්කම් සියල්ල අභිබවා යමින් ප්‍රේක්‍ෂක අත්පොළසන් හඬ මෙන් ම සිවුරුහන් හඬ ද නැංවීමට සමත් වීය.

හැටවන නිදහස් උත්සවයත්, මෙම සංස්කෘතික උත්සවයත් සංවිධානය කිරීමෙහිලා යෙදුණ “කොමිටි ෆො ශ්‍රී ලංකා” සංවිධානයටත්, ධම්මදීප භාවනා මධ්‍යස්ථ ානයටත් ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අප සැමගේ කෘතඥතාවය හිමිවිය යුතු වන්නේය. අපේ දේ ඇගයීම වෙනුවෙන්ය ඒ.

පන් ලිවිල්ල හමාර කළා. “පින් යනකොට කියාගෙ න ගිය සින්දුව නිදහස් දා ට නම් අපූරුයි” පන්ටත් ඒ සින්දුව ඉබේටම මිමිණුනා.

“නිවහල් සිතුවිලි මවනා සිතත් උදාරයි....”


